ජර්මනියේ ප්‍රදේශ ගණනාවකින්ද මේ වන විට නව කොරෝනා (Covid - 19) අසාදිතයන් වාර්තා වී ඇති බැවින් තම පෞද්ගලික සෞඛ්‍යය හා ආරක්ෂාව පිළිබඳ අවධානය යොමුකරන ලෙසත් ෆෙඩරල් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිර්දේශ කර ඇති පූර්ව ආරක්ෂණ ක්‍රම අනුගමනය කරන ලෙසත් ජර්මනියේ වෙසෙන සියළු ශ්‍රී ලාංකිකයින්ගෙන් ඉල්ලා සිටිමු.

පහත සඳහන් පුද්ගලයින් නියමිත සෞඛ්‍ය අංශ වෙත යොමුවන ලෙස සෞඛ්‍ය බලධාරීන් උපදෙස් දී ඇත.

- දින 14 ක් තුළ තර්ජනයට ලක්වූ ප්‍රදේශයක සිටි පුද්ගලයින්
- තර්ජනයට ලක් වූ ප්‍රදේශයක සිටින්නන් සමග සබඳතා පැවැත්වූවන්
- අසාදිත බවට තහවුරුකරගත් අයෙකු සමග සබඳතා පැවැත්වූවන්

නව කොරෝනා (Covid - 19) අසාදිත බවට සැකකෙරෙන පුද්ගලයින් හට පවුලේ වෛද්‍යවරයා වෙත යොමුවිය හැකි අතර හදිසි වෛද්‍ය සේවය සමග අංක 116117 ඔස්සේ දුරකථනයෙන් සම්බන්ධ විය හැක.

ෆෙඩරල් සෞඛ්‍ය අමාත්‍යාංශය පහත සඳහන් දුරකථන අංක හදිසි ඇමතුම් අංක ලෙස ප්‍රකාශයට පත්කර ඇත.

- සෞඛ්‍ය උපදේශක සේවය - 08000117722
- ෆෙඩරල් සෞඛ්‍ය අමාත්‍යාංශය (මහජන ඇමතුම්) - 030346465100
- පොදු තොරතුරු මධ්‍යස්ථානය - අංක 115 (www.115.de)

ජර්මනියේ වෙසෙන ශ්‍රී ලාංකිකයින්හට නව කොරෝනා තත්වය සම්බන්ධ ගැටළු වලදී සහයෝගය ලබාදීම සඳහා ශ්‍රී ලංකා තානාපති කාර්යාලය පැය 24 පුරා ක්‍රියාත්මක විශේෂ දුරකථන මාර්ග 02 ක් ස්ථාපනය කොට ඇත.

**+49 71 23111944/ +49 71 23110026**

මීට අමතරව පහත දුරකථන මාර්ග ඔස්සේද සතියේ දිනවල කාර්යාල වේලාවන් තුලදී තානාපති කාර්යාලය සම්බන්ධ කරගත හැක.

**+49 30 80909749/ +49 30 80909761**

ශ්‍රී ලංකා තානාපති කාර්යාලය
බර්ලින්
ජර්මනිය